WWW.ASKNETWORK.NET

Sinhala

දේව වචනය සමඟ ඉල්ලා සිටීම තුළින්

... බලය, හෙළිදරව්ව සහ අනාවැකිමය සත්‍යය නිදහස් කරයි

ඔබේ නාමයත්, ආඥත්
උත්තරීතර බව ඔබ පෙන්වූ සේක. ගීතාවලිය 138:2

මාගේ නාමයෙන් ඉල්ලා සිටින්න යයි යේසුස්වහන්සේ කීසේක...

ASK Network හි සුවිශේෂී කැඳවීම වන්නේ අප යාච්ඤා කරන්නට පෙර සහ ක්‍රියා කරන්නට පෙර දෙවියන්වහන්සේට සවන් දීම ය.ශුද්ධාත්මයාණන්වහන්සේ හෙළිදරව් කරන දෙයට ප්‍රතිචාර දක්වන්නට වගකීම ගනිමින්, අපි උන්වහන්සේගේ වචනය තුළින් උන්වහන්සේ කථාකරන තෙක් අප බලා සිටින්නෙමු. අපි එසේ කරන්නේ දේව වචනය උද්‌ඝෝගයෙන් හා උනන්දුවෙන් යාච්ඤා කිරීමෙන් සහ පසුව එයට කීකරු වීමෙන් ය. දෙවියන්වහන්සේ අපගේ වචන සහ ක්‍රියාවන් රැගෙන, උන්වහන්සේගේ මහිමය උදෙසා, බලයෙන් ක්‍රියා කරමින් උන්වහන්සේගේ අරමුණු ඉටු කරගන්නා සේක.

දෙවියන්වහන්සේට පවසන්නට ඇති දෙයට සවන් දෙන්න... ඔබ යාච්ඤා කරන දෙයට උන්වහන්සේ සවන් දෙන සේක.

මෙම කාඩ් පත අනෙක් පිට පෙරළා දේව වචනය යාච්ඤා කරන්නේ කෙසේද යන්න සරල ප්‍රතිපත්ති සොයාගන්න. වැඩිදුර ඉගෙනීම සඳහා, අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න



සභාව, ප්‍රජාව සහ සියළු දේශයන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ වචනය යාච්ඤා කරන්න

දෙවියන්වහන්සේගේ වචනය යාච්ඤා කිරීම යනු ඔබගේ බයිබලය ඇර එහි සත්‍යයන් ප්‍රකාශ කිරීම තරම් සරල දෙයකි. නමුත් එය මෙනෙහි කිරීම තුළින් වඩාත් ගැඹුරු අවබෝධයක් ලැබෙනවා ඇත.වඩාත් හොඳම ගුරුවරයා ශුද්ධාත්මයාණන්වහන්සේ ය: වඩාත් ගැඹුරු සහ ගතික ඉල්ලා සිටීමක් වෙත මෙම සරල පියවර අනුගමනය කරන විට, ඔබව සියළු සත්‍යයන් කරා ඔබව ගෙන යාමට උන්වහන්සේට ඉඩදෙන්න.

යේසුස්වහන්සේ කළා සේ යාච්ඤා කරන්නට **කාලය වෙන් කරන්න.** උන්වහන්සේගේ මඟපෙන්වීම අනුව උපවාසයේ යෙදෙන්න. ලූක් 5:16, මතෙව් 6:17

යේසුස්වහන්සේ ඉගැන්වූවා සේ, හැකි නම් **අන් අය සමඟ එකතුවෙන්න.** මතෙව් 18:19-20

පාපොච්චාරණය සහ පසුතැවිලි වීම සමඟ **ඔබව සුදුනම් කරගන්න.** 1 යොහන් 1:9

දෙවියන්වහන්සේට නමස්කාර කරමින් උන්වහන්සේගේ චරිතය ඒත්තුගන්න. මතෙව් 6:9

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආරක්ෂාව ඉල්ලා සිටින්න. එපීස 6:10-18

දෙවියන්වහන්සේගේ හදවතේ ඇති දේ ඔබ තුළට කාවද්දනු ඇතැයි අපේක්ෂා කරන්න, එමඟින් ඔබට ඉල්ලා සිටීමට අවධානය යොමු කළ හැකිය. යෙසායා 55:8

සුදුසු දේවවචනයකට ඔබව මඟපෙන්වන්නට **දෙවියන්වහන්සේ විශ්වාස කරන්න.** ගීතාවලිය 37:23

එම කොටස අවධානයෙන් කියවන්න. ශුද්ධාත්මයාණන්වහන්සේ සමහර වචන හෝ අදහස් වෙතට ඔබගේ අවධානය යොමු කරන තෙක් නැවත නැවතත් කියවන්න. යොහන් 16:13

එය මෙනෙහි කරන්න. අවබොධය ලැබෙන පිණිස දෙවියන්වහන්සේ කෙරෙහි බලා සිටින්න. ගීතාවලිය 119:30

දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කරන විට උන්වහන්සේගෙන් අවබෝධය ලබන බැවින්, එයට **පෞද්ගලිකව ප්‍රතිචාර දක්වන්න** සහ එහි සත්‍යයට ඔබගේ ජීවිතයට බලපෑම් කිරීමට ඉඩ දෙන්න. එසකියෙල් 3:1

දෙවියන්වහන්සේ තම වචනයෙන් ඔබට පෙන්වන සත්‍යය, උන්වහන්සේගේ අරමුණු ගැන විමසීමට ඔබට තීක්ෂ්ණ බුද්ධියක් ලබා දෙන ආකාරය ගැන අවධානයෙන් යුතුව සැළකිලිමත් වෙන්න. 1 කොරින්ති 2:10

දෙවියන්වහන්සේ පෙන්වා ඇති දේ වාර්තා කරන්න. උන්වහන්සේ එක් එක් කෙනාට හෙළිදරව් කර ඇති දේ බෙදාගනු ලබන පිණිස ඒවා ලියා තබන්න හෝ එකට කථාකරන්න. හබක්කුක් 2:2

දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබගේ ඉල්ලීම් බලවත් ආයුධ බව විශ්වාස කරමින් උන්වහන්සේ ඔබට පෙන්වා ඇති දේ යාච්ඤාවෙන් ඉල්ලා සිටින්න. 2 කොරින්ති 10:4-6; යාකොබ් 5:16

දෙවියන්වහන්සේ ඔබගෙන් ඉල්ලා සිටින ඔනෑම දෙයක් කරන්නට **විප්ලවකාරී ලෙස කීකරුවන්නට** සූදානම්ව සිටින්න. යොහන් 2:5

දෙවියන්වහන්සේට ස්තුති කරන්න. උන්වහන්සේ යාච්ඤා වලට පිළිතුරු දෙන සේක. 1 යොහන් 5:14